(අන්තර්ජාල අනුවාදයකි).

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1999 අංක 11 දරන ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩ පැවැත්වීමේ පනත

---

[සහතිකය සටහන් කළේ **1999** මැයි මස **24** වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 මැයි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. **9.00** යි. තැපැල් ගාස්තුව : රු. **3.50** යි.

1999 අංක 11 දරන ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර
මැඩ පැවැත්වීමේ පනත

[සහතිකය සටහන් කළේ 1999 මැයි මස 24 වැනි දින.]

එල්. ඩී.–ඕ. 17/98.

## ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩ පැවැත්වීමේ සම්මුතිය බලාත්මක කිරීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි

ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩ පැවැත්වීම සඳහා වූ සම්මුතියක් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් වර්ෂ එක්දහස් නවසිය අනූහතේ දෙසැම්බර් මස පහළොස් වන දින සම්මත කර ගනු ලැබ, සහ අත්සන් කිරීම සඳහා එම සම්මුතිය වර්ෂ එක්දහස් නවසිය අනූඅටේ ජනවාරි මස දොළොස් වන දින නිව්යෝර්ක් නගරයේ දී විවෘත කොට තබා තිබුණු හෙයින් ද ;

වර්ෂ එක්දහස් නවසිය අනූඅටේ ජනවාරි මස දොළොස් වන දින ශ්‍රී ලංකාවේ ආණ්ඩුව එම සම්මුතියේ අත්සන්කරුවකු බවට පත් වූ හෙයින්ද ;

එකී සම්මුතිය තහවුරු කිරීම සහ ඒ සම්මුතියේ විධිවිධාන ශ්‍රී ලංකාවේ බලාත්මක කිරීම සඳහා නෛතික විධිවිධාන සැලැස්වීම ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට අවශ්‍ය වී ඇති හෙයින්ද ;

එම නිසා දැන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

කෙටි නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**1**. මේ පනත 1999 අංක 11 දරන ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩ පැවැත්වීමේ පනත යනුවෙන් හඳුන්වන ලබන අතර, එක් දහස් නවසිය අනූ අටේ ජනවාරි මස දොළොස් වන දින නිව්යෝර්ක් නගරයේ දී අත්සන් කරන ලද ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩ පැවැත්වීමේ සම්මුතිය (මෙහි මින් මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන,) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලාත්මක වන දිනය ලෙස අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් සහතික කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේය.

සම්මුතිගත රාජ්‍යයන්.

**2**. සම්මුතියේ පාර්ශ්වකාර රාජ්‍යයන් කවරේදැයි අමාත්‍යවරයා විසින්, කලින් කළ, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, සහතික කරනු ලැබිය හැකිය. මේ වගන්තිය යටතේ නියමයක් පළ කරනු ලබන්නේ යම් රාජ්‍යයක් සම්බන්ධයෙන් ද ඒ රාජ්‍ය "සම්මුතිගත රාජ්‍යයක්" යනුවෙන් මෙහි මින් මතු සඳහන් කරනු ලැබේ.

ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර සම්බන්ධ වැරදි .

**3**. (1) (අ) මරණය හෝ දරුණු ශාරීරික තුවාල හෝ සිදු කිරීමේ : හෝ

(ආ) මහජන ප්‍රයෝජනයට ඇති ස්ථානයකට, රාජ්‍ය හෝ ආණ්ඩුවේ උපයෝගීතාවකට, මහජන ප්‍රවාහන පද්ධතියකට හෝ යටිතල පහසුකම් සැපයුමකට තදබල හානියක් සිදු කිරීමේ හා එම හානියෙන් තදබල ආර්ථික හානියක් සිදුවන හෝ සිදුවිය හැකි යයි දැන ,

නීති විරෝධීව හා චේතනාත්මකව පුපුරණ ද්‍රව්‍යයක් හෝ වෙනත් මාරක උපක්‍රමයක් එවැනි ස්ථානයකට, උපයෝගීතාවකට හෝ සැපයුමකට භාරදෙන, තබන යවන හෝ පත්තු කරන ඕනෑම පුද්ගලයකු මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන අතර, අධිචෝදනා මත මහාධිකරණය විසින් පවත්වනු ලබන නඩු විභාගයක දී ඔහු වරදකරු කරනු ලැබුවහොත් අවුරුදු පහළොවකට නොඅඩු සහ අවුරුදු විස්සකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබීමට ඔහු යටත් වන්නේ ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීමට තැත් කරන ;

(ආ) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීමට ආධාර සහ අනුබල දෙන ;

(ඇ) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීමට වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් හෝ සමග කුමන්ත්‍රණය කරන ,

යම් තැනැත්තකු, මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන අතර, අධිචෝදනා මත මහාධිකරණය විසින් පවත්වනු ලබන නඩු විභාගයක දී ඔහු වරදකරු කරනු ලැබුවහොත් (1) වන උපවගන්තියෙන් නියම කර ඇති දණ්ඩනයට ම ඔහු යටත් වන්නේ ය.

මේ උපවගන්තියේ "අනුබල දීම" යන්නට දණ්ඩ නීති සංග්‍රහයේ 100 සහ 101 වගන්තිවල දී ඇති අර්ථය ම ඇත්තේ ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය හෝ යටතේ වූ යම් වරදක්, ශ්‍රී ලංකාවේ දේශයෙන් පිටත දී, පහත දැක්වෙන කවර වුව ද අවස්ථාවක දී එනම්, -

(අ) වරද සිදු කළේ යයි කියනු ලබන තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන හෝ, සිරිත් පරිදිම ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින අදේශික තැනැත්තකු වන අවස්ථාවක දී ;

(ආ) වරද සිදු කර ඇත්තේ ශ්‍රී ලංකාවේ පුරවැසියකුට විරුද්ධව වන අවස්ථාවක දී ;

(ඇ) වෙනත් යම් රටක පිහිටි ශ්‍රී ලංකාවේ යම් තානාපති කාර්යාලයකට හෝ ශ්‍රී ලංකාවේ යම් රාජ්‍ය දූත හෝ කොන්සල් පරිශ්‍රයකට හෝ වෙනත් යම් දේපළකට හෝ විරුද්ධව ඒ වරද සිදු කර ඇති අවස්ථාවක දී ;

(ඈ) යම් ක්‍රියාවක් කිරීමට හෝ කිරීමෙන් වැළකී සිටීමට හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට බල කිරීමේ චේතනාවෙන් ඒ වරද සිදු කොට ඇති අවස්ථාවක දී ; හෝ

(ඉ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් සේවයේ යොදවා ඇති ගුවන් යානයක් තුළ දී ඒ වරද සිදු කොට ඇති අවස්ථාවක දී ,

ඒ වරද සම්බන්ධයෙන් නඩු විභාග කිරීමේ අධිකරණ බලය මහාධිකරණයට ඇත්තේ ය.

4. මේ පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් නඩු විභාග කිරීමට මහාධිකරණය වෙත පවරා ඇති අධිකරණ බලය,කොළඹ දී පැවැත්වෙන ශ්‍රී ලංකා මහාධිකරණය විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ග ව්‍යවස්ථාව මගින් බස්නාහිර පළාත සඳහා පිහිටුවන ලද පළාත් බද මහාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

මහාධිකරණයේ අධිකරණ බලය.

මේ පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් සිරභාරයට ගනු ලැබූ යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්.

**5**. මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තෙකු සිර භාරයට ගනු ලැබූ අවස්ථාවක දී, –

(අ) ඔහු රටවැසියකු වන රාජ්‍යයේ හෝ වෙනත් ආකාරයකින් ඔහුගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හිමිකම ඇති රාජ්‍යයේ නිසි නියෝජිතයා සමග හෝ, ඔහු අවාසික තැනැත්තෙකු නම්, ඔහු සිරිත් පරිදි වාසය කරන දේශයේ හෝ රාජ්‍යයේ ආසන්නතම නිසි නියෝජිතයා සමග හෝ අප්‍රමාදව සංදේශනය කිරීමට ;

(ආ) ඒ රාජ්‍යයේ නියෝජිතයකු විසින් ඔහු හමුවීමට පැමිණීම ; සහ

(ඇ) (අ) සහ (ආ) ඡේද යටතේ ඔහුගේ අයිතිවාසිකම් ගැන ඔහුට අවබෝධයක් ලබා දෙනු ලැබීමට ,

ඒ තැනැත්තාට හිමිකම ඇත්තේ ය.

උදර්පණය කිරීම සඳහා ඉල්ලුම් කර ඇති තැනැත්තන් සම්බන්ධයෙන් ගනු ලැබ ඇති පියවර කවරේදැයි ඒ උදර්පණය සඳහා ඉල්ලුම් කරන රටට අමාත්‍යවරයා විසින් දැනුම් දිය යුතු බව.

**6**. මේ පනතේ උපලේඛනයෙහි සඳහන් කොට ඇති වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබ හෝ වරදකරු කරනු ලැබ ඇති යම් තැනැත්තකු උදර්පණය කිරීම සඳහා ඉල්ලීමක් සම්මුතිගත රාජ්‍යයක ආණ්ඩුව විසින් හෝ එය වෙනුවෙන් හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව නඩු පැවරීමට හෝ ඔහු උදර්පණය කිරීමට හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගනු ලැබ ඇති හෝ ගනු ලැබීමට යෝජිත හෝ පියවර කවරේදැයි, යට කී ඉල්ලීම ඉදිරිපත් කරන රාජ්‍යයේ ආණ්ඩුව වෙත, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් අමාත්‍යවරයා විසින් නොපමාව ම දැනුම් දිය යුතු ය.

මෙහි උපලේඛනයෙහි සඳහන් වැරදි සම්බන්ධයෙන් වූ විධිවිධාන, සම්මුතිගත රාජ්‍යයන් සමග දැනට පවත්නා උදර්පණ වැඩ පිළිවෙල මගින් සලස්වා ඇති විධිවිධාන ලෙස සැලකිය යුතු බව.

**7**. සම්මුතිගත යම් රාජ්‍යයක් සමග ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඇති කර ගනු ලැබූ යම් උදර්පණ වැඩ පිළිවෙලක් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී බලාත්මකව පැවතියේ නම්, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ උදර්පණය සඳහා සලස්වා ඇති විධිවිධානවලට මේ පනතේ උපලේඛනයේ සඳහන් උදර්පණය කළ යුතු වැරදි ද ඇතුළත් වන්නේ යයි ඒ පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

**8**. සම්මුතිගත යම් රාජ්‍යයක් සමග උදර්පණ වැඩ පිළිවෙලක් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඇති කර ගෙන නොමැති අවස්ථාවක දී, මේ පනතේ උපලේඛනයෙහි සඳහන් වැරදි සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ එකී සම්මුතිගත රාජ්‍යය අතර ඇති කර ගෙන තිබෙන වැඩ පිළිවෙලක් ලෙස, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මෙම සම්මුතිය උදර්පණ වැඩ පිළිවෙලක් ලෙස සලකනු ලැබිය හැකි ය.

මෙහි උපලේඛනයෙහි සඳහන් වැරදි සම්බන්ධයෙන්, මේ සම්මුතිය, ශ්‍රී ලංකාව සහ සම්මුතිගත ඇතැම් රාජ්‍යයන් අතර ඇතිකරගෙන තිබෙන උදර්පණ වැඩ පිළිවෙලවල් ලෙස, අමාත්‍යවරයා විසින් සලකනු ලැබිය හැකි බව.

**9**. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ එහි උපලේඛනයේ "ආ" කොටසට පෙරාතුව ම පහත දැක්වෙන අයිතමය ඇතුළත් කිරීමෙන් :–

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන පනත සංශෝධනය කිරීම.

"41. ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩ පැවැත්වීමේ සම්මුතියේ අර්ථානුකූල වූ –

(අ) මරණය හෝ දරුණු ශාරීරික තුවාල හෝ සිදු කිරීම ; හෝ

(ආ) සිදු කරනු ලබන විනාශය හේතු කොට ගෙන තදබල ආර්ථික හානියක් සිදුවන හෝ සිදුවිය හැකි හෝ ආකාරයට යම් පොදු ප්‍රයෝජනය සඳහා වූ රාජ්‍ය හෝ ආණ්ඩුවේ උපයෝගීතාවකට, පොදු ප්‍රවාහන පද්ධතියකට හෝ යටිතල පහසුකම් සැපයුමකට තදබල විනාශයක් සිදු කිරීමේ ,

චේතනාවෙන් පොදු ප්‍රයෝජනය සඳහා වූ ස්ථානයකට, රාජ්‍ය හෝ ආණ්ඩුවේ උපයෝගීතාවයකට, පොදු ප්‍රවාහන පද්ධතියකට හෝ යටිතල පහසුකම් සැපයුමකට හෝ එවැන්නක් තුළට හෝ එවැන්නකට විරුද්ධව හෝ නීති විරෝධී ලෙස සහ චේතනාන්විතව ම පුපුරණ ද්‍රව්‍යයක් හෝ වෙනත් මාරක උපක්‍රමයක් ගෙනවුත් භාරදීම, තැබීම, යැවීම, පත්තුකිරීම හෝ පිපිරවීම. ".

මේ පනත යටතේ වූ වැරදි උදර්පණ පනතේ කාර්ය සඳහා දේශපාලන වැරදි යනාදියක් නොවිය යුතු බව.

**10**. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ කුමක් සඳහන් වුව ද, ඒ පනතේ උපලේඛනයේ 'ආ' කොටසේ සහ මේ පනතේ උපලේඛනයේ සඳහන් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ සම්මුතිගත යම් රාජ්‍යයක් අතර උදර්පණය කිරීමේ කාර්ය සඳහා හෝ සම්මුතිගත රාජ්‍යයකට 11 වන වගන්තිය යටතේ ආධාර කිරීමේ කාර්යය සඳහා හෝ පමණක්, දේශපාලනමය ස්වභාවයක වරදක් හෝ දේශපාලනමය වරදකට සම්බන්ධ වරදක් හෝ දේශපාලන චේතනා මගින් පොළඹවනු ලැබූ වරදක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

සම්මුතිගත රාජ්‍යවලට ආධාර කිරීම.

**11** ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ සම්මුතිගත රාජ්‍යයක් අතර එවැනි ගිවිසුමක් හෝ වෙනත් වැඩ පිළිවෙලක් ඇති අවස්ථාවක දී සාක්ෂි සහ ප්‍රකාශ ලබා ගැනීමට සහ සිතාසි භාර දීමට අදාළ සහාය ද,ඇතුළුව මේ පනතේ 3 වන වගන්තිය යටතේ වූ වරදක් හෝ මේ පනතේ උපලේඛනයේ සඳහන් වරදක් හෝ සම්බන්ධයෙන් විමර්ශනය කර නඩු පැවරීම සඳහා අවශ්‍ය සියලු සහාය සම්මුතිගත රාජ්‍යයකට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් දිය යුතු අතර, සම්මුතිගත රාජ්‍යයකින් එවැනි සහාය අමාත්‍යවරයා මගින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

වැරදි වැළැක්වීම සඳහා ආණ්ඩුව විසින් පියවර ගනු ලැබිය යුතු බව.

**12**. මේ පනත යටතේ වූ වරදක් හෝ මේ පනතේ උපලේඛනයේ සඳහන් යම් වරදක් හෝ ශ්‍රී ලංකාවේ දී හෝ ඉන් පිටත දී හෝ සිදු කිරීමෙන්, එවැනි වරදක් සිදු කිරීමට ධෛර්ය දීමෙන්, පෙළඹවීමෙන්, සංවිධානය කිරීමෙන් හෝ දැන දැනම එවැනි වරදකට මුදල් යැවීමෙන් යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් වළක්වාලීම සඳහා අවශ්‍ය නිසි පියවර ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**14**. මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,–

"පුපුරණ හෝ වෙනත් මාරක උපක්‍රමයක් " යන්නෙන්,–

(අ) මරණය, බරපතල ශාරීරික තුවාල හෝ බලවත් ද්‍රව්‍යමය හානි සිදු කිරීම සඳහා සැලසුම් කරන ලද හෝ එවැන්නක් සිදු කිරීමේ ශක්තිය ඇති පුපුරණ හෝ ගිනි අවුලන ආයුධයක් හෝ උපක්‍රමයක් ; හෝ

(ආ) මුද්‍රා හැරිය විට, විසුරුවා හැරිය විට හෝ මූලික රසායන ද්‍රව්‍ය, ජෛවීකාරක, ධූල හෝ එවැනි ද්‍රව්‍ය හෝ විකිරණය හෝ විකිරණශීලී ද්‍රව්‍ය සමග ගැටුණු විට මරණය, බරපතළ ශාරීරික තුවාල හෝ බලවත් ද්‍රව්‍යමය හානි සිදු කිරීම සඳහා සැලසුම් කරන ලද හෝ එවැන්නක් සිදු කිරීමේ ශක්තිය ඇති ආයුධයක් හෝ උපක්‍රමයක්

අදහස් වේ ;

"යටිතල පහසුකම" යන්නෙන්, ජනතාවගේ ප්‍රතිලාභය සඳහා ජලය, මලාපවහනය, බලශක්තිය, ඉන්ධන හෝ සංදේශනය වැනි සේවා සපයන හෝ බෙදා හරින හෝ පොදු නැතහොත් පෞද්ගලික අයිතිය දරන පහසුකමක් අදහස් වේ ;

"පොදු ප්‍රයෝජනය සඳහා වූ ස්ථානය" යන්නෙන්, අඛණ්ඩව ම හෝ කලින් කල හෝ ඉඳහිට හෝ මහජනයාට ප්‍රවිෂ්ට විය හැකි හෝ මහජනයාට විවෘතව ඇති හෝ යම් ගොඩනැගිල්ලක, ඉඩමක, වීදියක, ජල මාර්ගයක හෝ වෙනත් යම් ස්ථානයක කොටස් අදහස් වන අතර, එසේ මහජනයාට ප්‍රවිෂ්ට විය හැකි හෝ විවෘතව ඇති වාණිජ, ව්‍යාපාරික, සංස්කෘතික, ඓතිහාසික, අධ්‍යාපනික, ආගමික හෝ ආණ්ඩුවේ යම් ස්ථානයක් හෝ විනෝදාංශ හෝ විනෝද ක්‍රීඩා කටයුතු සඳහා වූ යම් ස්ථානයක් හෝ මහජනයාට එසේ ප්‍රවිෂ්ට විය හැකි හෝ විවෘතව ඇති එවැනි වෙනත් යම් ස්ථානයක් ඊට ඇතුළත් වේ ;

"පොදු ප්‍රවාහන පද්ධතියක්" යන්නෙන්, පුද්ගලයන් හෝ බඩු බාහිරාදිය ප්‍රවාහනය කිරීමේ සේවය සඳහා යොදවා ඇති, පොදු හෝ පුද්ගලික අයිතිය දරන සියලු පහසුකම්, රථවාහන සහ උපකරණ අදහස් වේ ;

"රාජ්‍ය හෝ ආණ්ඩුවේ උපයෝගීතාවක්" යන්නට, යම් රාජ්‍යයක නියෝජිතයන් විසින් හෝ, ආණ්ඩුවේ හෝ ව්‍යවස්ථාදායකයේ හෝ අධිකරණයේ හෝ සමාජිකයන් විසින් හෝ, රජයේ හෝ වෙනත් යම් රාජ්‍ය ආයතනයක හෝ අස්ථිතයක හෝ නිලධරයන් නැතහොත් සේවකයන් විසින් හෝ, අන්තර්ආණ්ඩු සංවිධානයක නිලධරයන් හෝ සේවකයන් විසින් තම නිල කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන යම් ස්ථිර හෝ තාවකාලික හෝ උපයෝගීතාවක් හෝ රථවාහන ඇතුළත් වේ ;

උපලේඛනය (6,7,8 සහ 10 වන වගන්ති)

1. පොදු ප්‍රයෝජනය සඳහා වූ ස්ථානයකට, රාජ්‍ය හෝ ආණ්ඩුවේ උපයෝගීතාවකට, පොදු ප්‍රවාහන පද්ධතියකට හෝ යටිතල පහසුකමකට,

(අ) මරණය හෝ බරපතළ ශාරීරික තුවාල සිදු කිරීමේ ; හෝ

(ආ) සිදු කරනු ලබන විනාශය හේතු කොටගෙන තදබල ආර්ථික හානියක් සිදුවන හෝ සිදුවිය හැකි හෝ ආකාරයට ඒ ස්ථානයට, උපයෝගීතාවට, පද්ධතියට හෝ පහසුකමට තදබල විනාශයක් සිදු කිරීමේ ,

චේතනාවෙන් එවැනි පොදු ප්‍රයෝජනය සඳහා වූ ස්ථානයකට, රාජ්‍ය හෝ ආණ්ඩුවේ උපයෝගීතාවයකට, පොදු ප්‍රවාහන පද්ධතියකට හෝ යටිතල පහසුකම් සැපයුමකට, එවැන්නක් තුළ හෝ එවැන්නකට විරුද්ධව නීති විරෝධී ලෙස චේතනාන්විතව ම පුපුරණ හෝ වෙනත් මාරක උපක්‍රමයක් ගෙනවුත් භාරදීම, තැබීම, පත්තුකිරීම හෝ පිපිරවීම,

2. (1) වන ඡේදයේ සඳහන් යම් වරදක් සිදු කිරීමට තැත් කිරීම ;

3. (1) වන ඡේදයේ සඳහන් යම් වරදක් සිදු කිරීමට ආධාර සහ අනුබල දීම.

4. (1) වන ඡේදයේ සඳහන් යම් වරදක් සිදු කිරීමට වෙනත් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් හෝ සමග කුමන්ත්‍රණය කිරීම.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.